## තනතුරු වලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමයි.

**<u>අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය</u>**

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන කටයුතු පුළුල් කරමින් ක්‍රියාත්මක කිරීමේ අරමුණු ඉටුකර ගැනීම පිණිස පිහිට වූ මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත තනතුරු වලට ඇමුණුමේ සඳහන් සුදුසුකම් සහිත ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. තම අයදුම්පත්‍රය සමඟ තමා ඉල්ලුම් කරන ක්ෂේත්‍රයේ විශේෂ පලපුරුද්දක් හෝ සේවාවක නිරතව සිටියේ නම් එම විස්තරද ඇතුළත් කර ජීව දත්ත පත්‍රිකාවක් සමඟ අදාළ ආයතන ප්‍රධානියා මාර්ගයෙන් 2020.10.07 දිනට පෙර පහත ලිපිනයට ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

**ආචාර්ය එම්. උපාලි සේදර**
ලේකම්
අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
ඉසුරුපාය
පැලවත්ත
බත්තරමුල්ල

දු.ක. : 011 -2413865

### අයදුම්පත් කැඳවනු ලබන තනතුරු

| අයදුම්පත් කැඳවනු ලබන තනතුරු | තනතුරු සංඛ්‍යාව හා වැටුප් කේතය | ශ්‍රේණිය/ පන්තිය | විශේෂ සුදුසුකම් | තනතුරු මඟින් අපේක්ෂිත සේවා ක්ෂේත්‍රය |
|---|---|---|---|---|
| අධ්‍යාපන අධ්‍යක්ෂ | 01<br>SL1-2016 | ශ්‍රී ල.අ.ප.සේ. I පන්තිය | I. අධ්‍යාපන සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳව ප්‍රදේශීය දැනුම/ පළපුරුද්ද<br>II. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මීට පෙර ලබා ඇති පලපුරුද්ද හා දැනුම | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | 01<br>SL1-2016 | ශ්‍රී ල.අ.ප.සේ. I පන්තිය | I. දුරස්ථ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කටයුතු කොට ඇති පලපුරුද්ද<br>II. තොරතුරු තාක්ෂණ භාවිතයෙන් දුරස්ථ අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය කිරීමේ කටයුතු වල මීට පෙර ලබා ඇති අත්දැකීම්<br>III. විවෘත ඉගෙනුම් මාධ්‍යයන් භාවිතය පිළිබඳ දැනුම<br>IV. අධ්‍යාපන පරිපාලන ක්ෂේත්‍රය තුළ ලබා ඇති පළපුරුද්ද | දුරස්ථ අධ්‍යාපන ප්‍රවරධන කටයුතු |
| නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | 01<br>SL1-2016 | ශ්‍රී ල.අ.ප.සේ. II පන්තිය | I. අධ්‍යාපන සැලසුම්කරණය පිළිබඳ විශේෂ පුහුණුවීම් හා ප්‍රායෝගික අත්දැකීම් සහිත වීම<br>II. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට සහභාගී වී ලබා ඇති අත්දැකීම් හා දැනුම | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ |
| නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ | 01<br>SL1-2016 | ශ්‍රී ල.අ.ප.සේ. II පන්තිය | I. දුරස්ථ අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව ලබා ඇති පුහුණුව/ දැනුම/ පලපුරුද්ද<br>II. තොරතුරු තාක්ෂණ ක්‍රමවේද දුරස්ථ අධ්‍යාපනය සඳහා භාවිතා කොට ලබා ඇති අත්දැකීම්/ ව්‍යාපෘති/ දැනුම සහිත වීම | දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන කටයුතු |
| සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | 01<br>SL1-2016 | ශ්‍රී ල.අ.ප.සේ. II පන්තිය | I. අධ්‍යාපන කළමනාකරණ හා සැලසුම්කරණය පිළිබඳව විශේෂ පුහුණුව/ පලපුරුද්ද<br>II. අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ ස්ථරවල සේවා ඉටු කිරීමෙන් ලද අත්දැකීම් සහිත වීම<br>III. තොරතුරු තාක්ෂණය සැලසුම් කටයුතු සඳහා භාවිතා කිරීමේ හැකියාව | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු |
| සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ | 01<br>SL1-2016 | ශ්‍රී ල.අ.ප.සේ. III පන්තිය | I. දුරස්ථ අධ්‍යාපන ප්‍රවේශයන් භාවිතය පිළිබඳ පලපුරුද්ද<br>II. තොරතුරු තාක්ෂණය භාවිතා කිරීමේ හැකියාව<br>III. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පලපුරුද්ද | දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන කටයුතු |